00162 (සියළුම හිමිකම් ඇවිරිණි)

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

## රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (11)

**කාලය පැය 03 යි.**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01 (අ) රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සළසා ඇති විධිවිධාන කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 14)

(ආ) රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය වෙත පැවරී ඇති බලතල මු.රෙ.126 ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

02 (අ) "රාජ්‍ය මූල්‍ය කළමනාකරණය විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා අභ්‍යන්තර විගණකට විශාල මෙහෙවරක් ඉටු කළ හැක". මෙම ප්‍රකාශය මු.රෙ.133 හා 134 ඇසුරින් සනාථ කරන්න. (ලකුණු 12)

(ආ) "රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යවසායයන් පිළිබඳ කාරක සභාව රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තුවේ කාර්යභාරය මැනවින් ඉටු කරනු ලබයි". සාකච්ඡා කරන්න. (ලකුණු 08)

03 (අ) "රජයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ කාර්යභාරය මෙතෙක් පැවති ක්‍රමයට වඩා වෙනත් මුහුණුවරකින් දැන් ඉටු කරනු ලබයි". සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) අළුතින් පිහිටු වන ලද දෙපාර්තමේන්තුවක දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස ඔබව පත් කර ඇත. මෙම දෙපාර්තමේන්තුවේ මූල්‍ය කටයුතු සංවිධානය කර ගනු ලබන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

04 (අ) රජයේ දේපලකට හානියක් සිදුවූ විට ගත යුතු ක්‍රියාමාර්ගය මු.රෙ.103 ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

(ආ) හානි පිළිබඳව ක්‍රියා කිරීමට බලය පැවරී ඇති නිලධාරීන් හා ඔවුන් වෙත පැවරී ඇති අධිකාරි සීමාවන් මු.රෙ.108 ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 08)

05 (අ) ආදායමින් ආපසු ගෙවීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ගය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) අගරු කළ චෙක්පත් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මු.රෙ.189 ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06 ලංසු ඇගයීමේ ක්‍රියා පටිපාටිය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7 වන පරිච්ඡේදය ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 20)

******************